# පරිසරය

## 4 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education



# 16. අපේ අතීත විත්ති

අපේ අතීතය පිළිබඳ අවබෝධයක් තිබීම අනාගතය ගොඩනංවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වෙයි. එම නිසා කුඩා කාලයේ සිට ම සිසුන්ට අපගේ අතීතය පිළිබඳ තොරතුරු ඉගෙන ගැනීමටත් ඒවා අගය කිරීමටත්, ආරක්ෂා කිරීමටත් මග පෙන්විය යුතු ය. එමෙන්ම අතීතයේ වූ ජන ක්‍රීඩා පිළිබඳ අවබෝධයක් ඔවුන්ට ලබා දීම ද ඉතා වැදගත් ය.

## යාපනය කොටුව

- යාපනය දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- පෘතුගීසීන් ගොඩනගන ලද මෙය 1680 දී ලන්දේසීන් අලුත්වැඩියා කරන ලදි.







## ගාල්ල කොටුව

- 1588 ගාලු ප්‍රදේශයේ පෘතුගීසීන් විසින් ඉදිකළ බලකොටුවකි.
- 17 වන සියවසේ ලන්දේසීන් විසින් නවීකරණය කරන ලදි.






Copyright© www.e-thaksalawa.moe.gov.lk



**සීගිරිය**

- මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- 180m පමණ උසැති පර්වතයකි.
- කාශ්‍යප රජතුමා මෙය කරවන ලදි.
- පැරණි ජල කොටුව, ජල උද්‍යාන හා ශිලා උද්‍යාන, කැටපත් පවුර, කුරුටු ගී, බිතුසිතුවම් ආදිය නිසා මේ බලකොටුව ලොව අටවන පුදුමය ලෙස මිනිසුන් හඳුන්වයි.



## ඓතිහාසික වැව්

**මින්නේරිය**

- පොළොන්නරුවේ පිහිටා ඇත.
- ක්‍රි.ව. 286 දී මහසෙන් රජු විසින් කරවන ලදී.
- වැව සාදන විට බැම්ම කැඩීයාම නිසා, රාජ කුමාරයා බිලි දීමට සැරසුණු විට , බිසව කුමරා රැගෙන පලාගිය අතර, රජතුමාගේ වැඩිමහල් සහෝදරියගේ පුතා බිලි දුන් බවද , ඉන් පසු බැම්ම කැඩී නොගිය බවත් කියැවේ.

**පරාක්‍රම සමුද්‍රය**

- පරාක්‍රමබාහු රජු විසින් කරවන ලදි.
- පොළොන්නරු දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- හෙක්ටයාර් 2539.5 ක පැතිරී ඇත.


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## කලාවැව

- උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- ධාතුසේන රජතුමා විසින් කරවන ලදි.
- පසු කාලීනව බළලු වැව කලා වැවට සම්බන්ධ කර වැව තවත් විශාල කර තනවා ඇත.
- අවුකන බුදු පිළිමය මේ සමීපයේ පිහිටා ඇත.

## බසවක්කුලම

- මෙය අභය වැව නමින් ද හඳුන්වයි.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වැවයි.
- පණ්ඩුකාභය රජු විසින් කරවන ලදි.

### ක්‍රියාකාරකම 1

- පහත නිර්මාණ කළ අය නම් කරන්න.

| නිර්මාණය | ඉදිකළේ කවුරුන් විසින් ද? |
|---|---|
| 01. යාපනය කොටුව | ........................................... |
| 02. ගාලු කොටුව | ........................................... |
| 03. සීගිරිය | ........................................... |

- පහත වැව් ඉදිකළ රජතුමා හා වැව පිහිටි දිස්ත්‍රික්කය නම් කරන්න.

| වැව | ඉදිකළ රජු | පිහිටි දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01.බසවක්කුලම | ........................... | ............................. |
| 02.කලාවැව | ........................... | ............................. |
| 03.මින්නේරිය වැව | ........................... | ............................. |
| 04.පරාක්‍රම සමුද්‍රය | ........................... | ............................. |


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 2

- ඔබ ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික ස්ථානයක් හෝ කිහිපයක් පිළිබඳව තොරතුරු රැස්කරගන්න. ඒවායේ පින්තූර ද සොයාගන්න. ඒවා අදාළ කරගෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.
- එම ඓතිහාසික ස්ථාන පිළිබඳව නිර්මාණය වී ඇති කතන්දර දෙමාපියන්ගෙන් අසා දැන ගන්න.
- "දකුණු ලකේ අගනගරේ ගාලු පුරේ සිරි " ගීතය වැඩිහිටියකුගේ උදව්වෙන් අසන්න.
- වඩාත් පෞරාණික, සංස්කෘතික මෙන්ම පාරිසරික වටිනාකමක් ඇති ස්ථාන හා ශාක පිළිබඳ තොරතුරු රැස් කරන්න.

### <u>ශ්‍රී ලංකාවේ මුල්ම තේ ගස.</u>

- 1839 හඳුන්වා දෙන ලද්දේ ජේම්ස් ටේලර් ය. වසර 150 ක් පමණ පැරණිය.
- හග්ගල, පේරාදෙණිය උද්භිත උද්‍යානවල සිටුවන ලදි.




### <u>මන්නාරමේ බයෝබැබ් ගස (Biobab)</u>
**(බෝතල් ගස / අලියා ගස)**

- **උස මීටර් 7.5 , වට ප්‍රමාණය මීටර් 19.5**
- **මන්නාරමේ පල්ලිමුනේ මාර්ගයේ ඇතුලට වෙන්නට දැක ගත හැකි වේ.**
- **අරාබි වෙළෙන්දන් විසින් ගෙනෙන ලදි. (අලි ගස නමින්ද හඳුන්වයි)**
- **වර්ෂ 800 ක් පමණ පැරණිය.**






Copyright© www.e-thaksalawa.moe.gov.lk



<u>ඕපනායක යෝධ පුස්වැල.</u>



- රත්නපුර දිස්ත්‍රික්කයේ ඕපනායක ප්‍රදේශයේ හුණුවල ගමේ පිහිටා ඇත.
- මෙය අවු. 400 පමණ පැරණි බව කියවේ.

<u>කැබලිත්තෑවේ සියඹලා ගස</u>



- යාල ජාතික වනෝද්‍යානයට අයත් අංක 02 කලාපයේ කුඹුක්කන් ඔය ආසන්නයේ ඇත.
- මෙහි ගොඩනැගිලි නොමැත. බැතිමතුන් මෙහි පුද පූජා පවත්වයි.
- මෙහි ඓතිහාසික වශයෙන් ගුප්ත හාස්කම් පවතී.


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## කැප්ටන් ඩෝසන් කුලුණ.




- කපිතාන් ඩෝසන් සිහි කිරීමට කොළඹ - මහනුවර මාර්ගයේ කඩුගන්නාව පිහිටි කපොල්ල ආසන්නයේ සාදා ඇත.
- 1820 වර්ෂයේ වරකාපොළ සිට අඹන්පිටිය දක්වා සැතපුම් 11 පමණ මේජර් තෝමස් ස්කිනර්ගේ අධීක්ෂණය යටතේ ද , ඉතිරිය ඩෝසන්ගේ අධීක්ෂණය යටතේ ද ඉදි විය.
- එතුමා සිහිවීමට මෙය තනවන ලදි.

## රිටිගල කන්ද.

- රිටි නමැති ගස් වර්ගයක් මෙහි ඇති නිසා මේ නම ලැබිණි.
- සී.පී. බෙල් මහතා කියවූ සෙල් ලිපියකට අනුව , සද්ධාතිස්ස රජුගේ දෙවු පුත් ලජ්ජාතිස්ස රිටිගල විහාරයක් සාදා ඇත.
- 1942 මෙය දැඩි ආරක්ෂිතයක් ලෙස නම් කර ඇත.
- තෙත් කලාපීය දේශගුණයක් ඇත.
- අවුරුද්ද පුරා නොසිඳී ගලා යන ජල උල්පතක් මෙහි ඇත.

## අම්බලම.

- අම්බලම යනු , දුරබැහැර යන්නන් සඳහා ඉදිකරන ලද තාවකාලික නවාතැනකි.
- කැටයම් ඇමූ ලීයෙන්ද , මැටියෙන්ද මේවා විවිධ නිර්මාණශීලීව ඉදිකර ඇත.
  උදා - පනාවිටිය අම්බලම, කුරුණෑගල.




Copyright© www.e-thaksalawa.moe.gov.lk



<u>නාමල් උයන හා රෝස තිරිවානා කන්ද.</u>

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්කිරියාගම උල්පතගම ග්‍රාමයේ නාමල් උයන හා රෝස තිරිවානා කන්ද පිහිටා තිබේ.
- ආසියාවේ විශාලතම රෝස පැහැති තිරිවානා කන්දයි.
- 8වන සියවසේ දේවානම්පිය තිස්ස රජු සමයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අභය භූමියකි.

## ක්‍රියාකාරකම 3

- ශ්‍රී ලංකාවේ මුල්ම තේ ගස හා බැඳී කථා පුවත අසා දැනගෙන එය චිත්‍රයට නගන්න.
- බයෝබැබ් ගසක් පිහිටා තිබීමෙන් පරිසරය සුරක්ෂිත වන ආකාරය පිළිබඳ කතන්දරයක් ගොඩනගන්න.
- කැප්ටන් ඩෝසන් කුලුණ පිහිටීමට මුල් වූ කථාව අසා දැනගෙන තොරතුරු ලියන්න.

## ක්‍රියාකාරකම 4

- ශ්‍රී ලංකාවේ බයෝබැබ් ගසක් පිහිටා තිබීමෙන් අපට/පරිසරයට ඇතිවෙන යහපත කුමක් ද?

  ......................................................................................................................

- රිටිගල කන්ද පිහිටි කන්දේ ඇති වැදගත්කම කුමක් ද ?

  ......................................................................................................................

- අතීතයේ අම්බලම් බිහිවුයේ කුමක් සඳහා ද ?

  ......................................................................................................................

- රෝස තිරුවානා කන්ද පිහිටි පුදේශයේ ඇති සුවිශේෂ ලක්ෂණ මොනවා ද ?

  ......................................................................................................................

අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම: ජී.කේ සත්‍ය ධනංජය ජයරත්න—භ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය
Copyright© www.e-thaksalawa.moe.gov.lk

**<u>ආචාර්ය ආනන්ද කුමාරස්වාමි.</u>**

- ආචාර්ය ආනන්ද කුමාරස්වාමි 1877-08-22 කොළඹ කොල්ලුපිටියේදී උපත ලැබීය.
- ඔහු විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ හා නිබන්ධන ප්‍රමාණය 500කට අධිකය.
- ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, ලතින්, ග්‍රීක්, සංස්කෘත, පාලි ආදී භාෂාවල විශිෂ්ටත්වයට පැමිණි අයෙකි.
- නීතිවේදියෙකු හා පරිවර්තයෙකි.
- පාලි භාෂාවෙන් ඇති බෞද්ධ ධර්ම ග්‍රන්ථ හා දෙමළ බසින් ඇති හින්දු ධර්ම ග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලදි.
- ලන්ඩන් වයික්ලික් විද්‍යාලයේ අධ්‍යාපන ලැබූ මෙතුමාගේ ප්‍රථම ශාස්ත්‍රීය ලේඛනය "ලංකාවේ කඳු හා මිනිරන් " වාරික සංග්‍රහයයි.
- " සිලෝන් නැෂනල් රිවිව් " සඟරාවේ සමාරම්භ සංස්කාරක වරයාද මෙතුමාය.
- මධ්‍යකාලීන සිංහල කලා, ජාතික අපේක්ෂණ, ඉන්දියානු ඉන්දුනීසියානු කලාවේ ඉතිහාසය මෙතුමා විසින් රචිත වෙනත් කෘතින්ය.
- වර්ෂ 1905 දී "ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය" අරඹන ලදි.
- 1947 සැප්තැම්බර් 09 දින ඇමරිකාවේ බොස්ටන් දී නුවර මිය ගියේ ය.

**<u>ආචාර්ය ටී.බී ජයා</u>**

- 1890 දී ජනවාරි 01 වන දා උපත ලැබී ය.
- ඔහු කොටහේන ශාන්ත පෝල් විදුහලෙන් ද, කොළඹ ශාන්ත තෝමස් විදුහලෙන් ද අධ්‍යාපනය ලැබුවේ ය.
- 1910 ජනවාරි මස මහනුවර ධර්මරාජ විදුහලේගුරුවරයෙකු ලෙස වැඩ භාර ගත්තේය. ග්‍රීක, ලතින්, ආර්ථික විද්‍යාව, ඉතිහාසය වැනි විෂයයන් තුළින් ශිෂ්‍යයන් තුළ දේශාභිමානය, එඩිතර බව, පෞරුෂත්වය ගොඩනැගෙන ලෙස ඉගැන්වීය.
- 1917 දී කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙක් ලෙස ද, 1921කොළඹ මරදාන සහිරා විද්‍යාලයේ විදුහල්පති ද විය.
- කොළඹ කයිරියා බාලිකා පාසල සහ ඩෙන් හැම් ඉංග්‍රීසි පාසල ආරම්භ කලේ ය.
- අලුත්ගම, ගම්පොළ, මාතලේ සහ පුත්තලම නගරවල සහිරා විද්‍යාලයද අලුත්ගම අඩ්ඩාලච්චේන නගරවල ගුරු විදුහල් ද ආරම්භ කලේ ය.
- ජාතික කොඩිය, ජාතික ගීය සම්පාදන කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකි.
- 1960 දී සවුදි අරාබියේ දීනා නගරයේදී මෙලොවින් සමු ගත්තේ ය.

අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම: ජී.කේ් සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය
Copyright© www.e-thaksalawa.moe.gov.lk

**එස් මහින්ද හිමි**

- 1901 දී ටිබෙට් රටේ සිකිම් ප්‍රදේශයේ උපත ලද එස්.මහින්ද හිමිගේ ගිහිකාලයේ නම එස්.කේ තෂිනම්ගල් වේ.
- එස්.කේ තෂිනම්ගල් වයස අවු.12 දී කොළඹ විද්‍යොදය පිරිවෙනට ඇතුල්ව පාලි , සිංහල, සංස්කෘතික භාෂා ඉගෙන ගත්තේ ය.
- මහාබෝධි විද්‍යාලයෙන් ඉංග්‍රිසි ද පොල්ගස්දූව ආරාමයෙන් ප්‍රාචීන භාෂා ද හැදෑරීය.
- දොඩන්දූවේ ශෛලබිම්බාරාමයේදී රත්ගම සිරි වූලසුමන හිමියන්ගේ ශිෂ්‍යයෙකු ලෙසින් පැවිද්ද ලබා ගත්තේය.
- ඒ හිමිපාණෝ 1934-1936 කාලය තුළ කොළඹ ආනන්ද විද්‍යාලයේ සිංහල, පාලි,බුද්ධ ධර්මය ඉගැන්වූහ.
- උන්වහන්සේ නව ලංකා දහම් පාසල හා ඉංග්‍රීසි පාඨශාලාව ආරම්භ කරන ලදි.
- ගව මස් කෑමෙන් ගම්මුන් වලකාලීමට තදින්ම ක්‍රියාකළ අතර සතර පේරුවේ ගම්වලින් බෙහෙත් එකතු කොට නොමිලේ බෙහෙත් දෙන පින් බෙහෙත් ශාලාවක් පිහිටු වූහ.
- එස්.මහින්ද හිමි ලංකාමාතා නිදහසේ මන්ත්‍රය , නිදහසේ දෑහැන , දරු නැළවිල්ල ඇතුළු ගද්‍ය, පද්‍ය කෘති 40ක් රචනා කර ඇත.
- මුල්ම කෘතිය "ඔවා මුතු දම" ද අවසාන කෘතිය "ශ්‍රී පාදය" ද වේ.
- 1951 මාර්තු 14 දා අපවත් විය.

**ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර**

- ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයකු මෙන්ම ජාතික වීරයෙකි.
- වර්ෂ1894 ඔක්තෝම්බර් මස 18 උපත ලැබී ය.
- අම්බලන්ගොඩ වෙස්ලියන් විදුහල හා ගාල්ලේ රිච්මන්ඩ් විදුහල්වල ඉගෙනුම ලැබූ ඔහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් රටවල හොදම ශිෂ්‍යයාට හිමි ත්‍යාගය හිමි කර ගත්තේ ය.
- රිච්මන්ඩ් විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස ඔහු ගුරුවෘත්තියට පැමිණ ඇත.
- මොහු මොරටුවේ වේල්ස් කුමාර විද්‍යාලය සහ කොළඹ වෙස්ලි විද්‍යාලයේ සේවය කළේ ය.
- වර්ෂ 1931 සිට 1946 කාලයේ ලංකාවේ අධ්‍යාපන ඇමති විය.
- පළමු ශ්‍රේණියේ සිට විශ්ව විද්‍යාලය දක්වා නිදහස් අධ්‍යාපනය නොමිලේ ලබා දීම සිදුකළේය.
- ඔහු භාෂාව අධ්‍යාපන මාධ්‍ය කළේ ය.
- පාසල් රජයට පවරා ගත්තේ ය.
- මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කළේ ය.
- ආදායම් අඩු පවුල්වල සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීම ආරම්භ කළේ ය.
- පොදු විෂය නිර්දේශයක් සකස් කළේ ය.


Copyright© www.e-thaksalawa.moe.gov.lk



- පාසල්වලට ක්‍රීඩා පිට්ටනි ලබා දුන් අතර , සංගීත, නැටුම්, මළල ක්‍රීඩා ඉගෙනීමට අවස්ථාව ලබාදුනි.
- දෙවන ශ්‍රේණියේ සිට ඉංග්‍රීසි විෂයක් ලෙස ඉගැන්වීම අනිවාර්ය කරන ලදි.
- ශ්‍රී ලංකාව අධ්‍යාපනය අතින් අසියාවේ දියුණුම රට වූයේ මේ සමයේ ය.
- නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස විරුදාවලිය ලැබී ය.

<u>ආතර් සී ක්ලාක්</u>

- දකුණු එංගලන්තයේ සමර්සෙට් ප්‍රදේශයේ මයින්හෙඩ් නගරයේ 1917 දෙසැම්බර් 16 වන දින උපත ලදි.
- විද්‍යාඥයෙකු මෙන්ම ප්‍රසිද්ධ ලේඛකයෙකු වූ ඔහු 1945 "වයර්ලස් වර්ල්ඩ්" යන සඟරාවේ පළකරන ලද ලිපියකින් ප්‍රසිද්ධ විය.
- පොළොවේ සිට අහසට චන්ද්‍රිකා යැවිය හැකි බවත්, එයින් පණිවිඩ හුවමාරු කළ හැකි බවත් ප්‍රකාශ කර ඇත.
- මෙතුමා වර්ෂ 1956 දී ශ්‍රී ලංකාවේ පදිංචියට පැමිණියේ ය.
- මොරටුව විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා මෙන්ම එංගලන්තයේ රාජකීය තාරකා විද්‍යාඥයන්ගේ සංගමයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය.
- මෙතුමාට උපාධි හා සම්මාන 35 ක් පිරිනමා ඇත.
- නයිට් පදවියෙන් ද පිදුම් ලබා ඇත.
- 2008 මාර්තු 19 වනදා ශ්‍රී ලංකාවේදී මිය ගියේ ය.

<u>ඕල්කට් තුමා</u>.

- වර්ෂ 1832.08.02 දින ඇමරිකා එක්සත් ජනපදයේ නිව් ජර්සි ප්‍රාන්තයේ උපත ලැබීය.
- හමුදා නිළධාරියෙකු මෙන් ම, නීතිඥයෙකු ලෙස ද කටයුතු කළ මෙතුමා මාධ්‍ය වේදියෙකු ද වේ.
- 1871.11.17 දින ඇමරිකාවේදී පරමවිඥානාර්ථ සමාගම පිහිටුවීය.
- 1880.05.19 සිරිලකට පැමිණ ගාල්ලේ විජයානන්ද විහාරයේදී පන්සිල් සමාදන්ව බෞද්ධයෙකු බවට පත්විය.
- පරම විඥානාර්ථ සමාගමේ ශාඛාවක් කොළඹ දී සහ ගාල්ලේ දී ආරම්භ කරන ලදි.
- බෞද්ධ පුනරුදය වෙනුවෙන් මහත් සේවාවක් ඉටු කරන ලදි.
- බෞද්ධ පාසල් ස්ථාපනය කරන ලදි.
- සරසවි සඳරැස පුවත්පත ආරම්භ කරන ලදි.
- වෙසක් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත් කිරීමට මුල් විය.
- බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමට මූලික වී කටයුතු කරන ලදි.



Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 5

- ඉහත තොරතුරු හොඳින් කියවා පිළිතුරු ලියන්න.

01. ආනන්ද කුමාරස්වාමි මහතා දැනසිටි භාෂා මොනවා ද?

..................................................................................................................

02. ආනන්ද කුමාරස්වාමි මහතාගේ ප්‍රථම ශාස්ත්‍රීය නිර්මාණය කුමක් ද ?

..................................................................................................................

03. කොළඹ මරදාන, සහිරා විදුහලේ විදුහල්පති තුමා වූ පුද්ගලයා කවුද?

..................................................................................................................

04. නිදහස් අධ්‍යාපනයේ පියා කව්ද?

..................................................................................................................

05. කන්නන්ගර මැතිතුමා කළ සේවාවන් පහක් ලියන්න.

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

06. එස්. මහින්ද හිමි උපත ලද්දේ කොහේද?

..................................................................................................................

07. උන්වහන්සේ ලියූ කෘති දෙකක් නම් කරන්න.

..................................................................................................................

..................................................................................................................

08. ආතර් සී. ක්ලාක් මහතාගේ උපන් රට කුමක්ද?

..................................................................................................................

09. එතුමා කළ අනාවැකිය කුමක්ද?

..................................................................................................................

10. ඕල්කට් තුමා කළ සේවාවන් දෙකක් ලියන්න.

..................................................................................................................

..................................................................................................................




Copyright© www.e-thaksalawa.moe.gov.lk